# කුජ මංගල දෝෂයට පිළිපැදිය යුතු ප්‍රතිකර්ම




### උපතින් ලග්නයේ පළමු ස්ථානය (1) කුජ ග්‍රහයා පිහිටීම නිසා ඇතිවන අශුභ ක්‍රියාවලින් මිදීමට කළ යුතු ප්‍රතිකර්ම

(1) ඉවසීම,

(2) කලබල නොවීම

(3) පරුෂ වචන කීමෙන් වැළකීම.

(4) හිස් වචන කීමෙන් වැලකීම

(5) ඊර්ෂ්‍යා , ක්‍රෝධ, වෛර නොකිරීම.

(6) අනුන් පාලනය කිරීමට නොයෑම.

(7) බොරු කීමෙන් වැළකීම

(8) මිතුරු මිතුරියන්ට උදව් උපකාර කිරීම,

(9) රැකියා ලබා දීමට උදව් කිරීම

(10) තම සේවක සේවිකාවන්ට අනුකම්පා කිරීම හා තාඩන පීඩන වලට පත් නොකිරීම

(11) තම නෑ හිතමිතුරුන්ට උදව් උපකාර කිරීම.

### උපතින් ලග්නයේ පළමු (4) කුජ ග්‍රහයා පිහිටීම නිසා ඇතිවන අකුසල කම් වලින් මිදීමට කළ යුතු ක්‍රියාමාර්ග

(1) තම මවට, සහෝදරියන්ට, තම වයසක සීයා, මිත්තණියන්ට, හා සේවිකාවන්ට, මිතුරියන්ට, ලඟම ඥාතීන්ට නිතරම උදව් උපකාර කිරීම, ආදර කරුණාව දැක්වීම

(2) නිවාස සාදා දීම, විදුලි බිල්, ජල බිල්, නිවාස ණය, අධ්‍යාපනයට උදව් උපකාර කිරීම, වාහන පරිත්‍යාගය, විවිධ මෝස්තර ඇඳුම් පැළඳුම් පරිත්‍යාග කිරීම.

(3) තම සැමියාගේ හෝ බිරිඳගේ මවට පියාට ඉතා ආදරයෙන් සැලකීම අසනීප කරදර බාධා වලදී උදව් උපකාර කිරීම.

(4) තම බිරිඳට හා දියණියට නිතරම ආදරයෙන් සැලකීම.

### කුජ ග්‍රහයා (7) උපතින්ම ජන්ම පත්‍රයේ පිහිටීමෙන් ඇතිවන අපල උපද්‍රව වලට කළ යුතු ප්‍රතිකර්ම

(1) කුජ 7 ට ගැලපෙන ක්ෂේත්‍රයක් හිමි කෙනෙකු සමඟ විවාහයට යෑම.

(2) තමා විවාහ වූ පසු අනියම් සබඳතා ඇතිකර නොගැනීම

(3) තම සැමියාට හෝ බිරිඳට වංචා කිරීම හා බොරු කියා රැවටීමෙන් වැලකීම.

(4) සැමියාගේ හෝ බිරිඳගේ මුදල් නොදන්වා ගැනීම හා වංචාකර රැවටීම හා අනිකුත් අයට රහසේ උදව් උපකාර කිරීමෙන් වැලකීම.

(5) මංගල උත්සව වලට උදව් උපකාර කිරීම. රන් ආභරණ, මංගල ඇඳුම්, හා යානවාහන පහසුකම් සැපයීම.

(6) අධික ආශාවලින් මිදීම.

(7) විවාහයෙන් පසු දෙදෙනා සාකච්ඡා කර විය හියදම් කිරීම හා අධික මිල දේපල හා යානවාහන මිලට නොගැනීම.

(8) තම බිරිඳගේ හා සැමියාගේ දෙමාපියන්ට හා සහෝදර සහෝදරියන්ට හැකි හැම විටම උදව් උපකාර කිරීම.

(9) විවාහ වීමට අදහස් කරන අයට උපදෙස් දීම, නවාතැන් පහසුකම් දීම, විවාහකර දීම, හා මංගල කටයුතු කර දීම.

(10) කතරගම දෙවියන්ට හා විෂ්ණු දෙවියන්ට පුද පූජා කිරීම.

(11) පත්තිනි මෑණියන්ට හා හනුමන්ත දෙවියන්ට පුද පූජා කිරීම.

(12) අඟහරුවාදා දිනවල බෝධි පූජා, ග්‍රහ පූජා, බණ ඇසීම, භාවනා කිරීම හා යොගා කිරීම ඉතාම ශුභයි.

### කුජ 10 යේ බලවත්ම ජන්ම ලාභී පුද්ගලයාට කළ යුතු ප්‍රතිකර්ම

(1) තම පියාට, සහෝදරයන්ට, පුරුෂයාට, පිරිමි දරුවන්ට, මහලු සීයාට, මහලු මිතුරන්ට, භාවනා යෝගීන්ට, සිඟ මන් වලින් ජීවත් වන අයට, වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම, සිත් සතුටු වන උපදෙස් ලබා දීම, යාන වාහන ලබා දීම, ඇඳුම් පැලඳුම්, පොත්පත් යන්ත්‍ර උපකරණ පරිත්‍යාග කිරීම ඉතා ශුභයි.

(2) තම මිතුරන්ට, ඥාතීන්ට හා දෙමව්පිය න්ට, රැකියා ලබා දීම, සේවකයන්ට උසස්වීම් ලබා දීම, ව්‍යාපාර කිරීමට උපදෙස් දීම හා මිල මුදලින් පරිත්‍යාගය

(3) තම ඥාතීන්ට හා මිතුරන්ට නීති රීති ප්‍රශ්න වලදී උදව් කිරීම මත්පැන්, දුම්පානය, හා මත්ද්‍රව්‍ය පාවිච්චි කරන මිතුරු මිතුරියන්ට ඉන් මිදීමට උපදෙස් හා ප්‍රතිකාර ලබා දීම

(4) කිසිම කෙනෙකු නීති ගැටලු වලට යොමු කරන චෝදනා නොකිරීම.

(5) තම බිරිඳ හෝ සැමියා නිතරම ඉතා ගුණ ගරුක කෙනෙකු ලෙස සැලකීම හා සමාජයට ප්‍රකාශ කිරීම. කිසිකෙනෙකුට අපහාස හා නින්දා නොකිරීම.

(6) තම නිවස හා එලිමහන ඉතා පිරිසිදු වට තබා ගැනීම, හා ප්‍රියමනාප ප්‍රනීත ආහාර පාන තම දරුවන්ට , බිරිඳට හා මිතුරු මිතුරියන්ට පරිත්‍යාග කිරීම.

(7) පූජක පක්ෂය නිවසට කැඳවා අටපිරිකර අඩංගුව ප්‍රනීත දාන මාන දීම. හා බණ දේශනා කිරීමට සැලැස්වීම.

(8) මස්, මාංශ, හා උෂ්ණ ආහාර අනුභ වය ආදියෙන් වැලකීම.

(9) අධික වේගයෙන් වාහන ධාවනය නොකිරීම.

### ලග්නයෙන් 2 කුජ පිහිටීමෙන් ඇති වූ අකුසල් නිම කිරීමට කළ යුතු ශුභ ක්‍රියා මාර්ග

(1) අනුන්ගේ මිල මුදල් ණයට ගෙන ගොස් හෝ සොර සිතින් ගෙන එය නොගෙවීම ඉතා අශුභයි. ඉන් ජීවිතයේ අවසාන කාලයේ දී ඉතා දුගී දුප්පත් වී ඔත්පල

42 වන පිටට




**මේ රූපය දෙස බලා සිටින ගමන් ඇස් රූපයෙන් ඔබ්බට නාභිගත කරන්න. ඔබ දුටුවේ කුමක්ද?**

